සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40ක් ලැබේ.
- ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

01. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරීවන ප්‍රධාන ලේඛනයක් වන්නේ ........................ යි.
(අත්සන් ලේඛනය/ලොග්සටහන් පොත/බඩු වට්ටෝරු පොත)

02. යම් ශිෂ්‍යයෙක් පාසලට ඇතුලත් වූ දිනය නිවැරදිව දැන ගැනීම සඳහා ...................................... උපකාරී වේ.
(නාම ලේඛනය/ලකුණු ලේඛනය/ඇතුලත්වීමේ ලේඛනය)

03. 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන නිසරුගේ උපන් දිනය නිවැරදිව ම බලාගත හැකි වන්නේ ............................ මගිනි.
(නාම ලේඛනය/ලකුණු ලේඛනය/ඇතුලත්වීමේ ලේඛනය)

04. පාසල් සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ ................................ තුමා ය.
(විදුහල්පති/විෂයභාර ගුරු/පංතිභාර ගුරු)

05. ඔබේ තොරතුරු ඇතුලත් කරමින් සකස් කරන ලද ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක අනිවාර්යයෙන් ම ................ ...................................... ඇතුලත් විය යුතුය.
(නම සහ පවුලේ අය/නම හා උපන්දිනය/උපන් දිනය හා පියාගේ නම)

- ප්‍රශ්න අංක 6-10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. ඔබ සුවිශේෂී පුද්ගලයෙකි. ඔබට සමාන කිසිවෙක් නැත. ඔබ ඔබව විය යුතුය. ඒ ඔබගේ අනන්‍යතාවයයි. ( )

07. තමන්ට කළ හැකි දේ තමන් කැමති දේ හඳුනාගෙන වඩාත් හොඳින් කිරීම තුළින් ඔබේ දක්ෂතා වැඩිදියුණු කරගත හැකි වේ. ( )

08. පාසල් ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක ලෙස ඔබේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා අයහපත් ජීවන අරමුණු ගොඩ නගා ගත යුතු වේ. ( )

09. පාසලේ පවතින විනය නීති රීති පද්ධතිය නොසලකා කටයුතු කිරීම තුළින් ඔබේ ගෞරවය ආරක්ෂා වේ. ( )

10. පාසල ක්‍රමවත්ව පාලනය කිරීම සඳහා නීති පද්ධතියක් අවශ්‍ය වේ. ( )

- ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. පුද්ගලයෙකුට තම දක්ෂතා හා හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේදයකි.
    I. පොතපත පරිශීලනයෙන් ඉවත් වීම.
    II. ප්‍රවීණයන් ඇසුරු නොකිරීම.
    III. විවිධ පුහුණු වැඩ සටහන්වලට සම්බන්ධවීම.
    IV. තමා නියෝජනය කරන සමාජ කණ්ඩාම් වලින් ඇත් වීම.

12. පාසල් ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක ලෙස ඔබට මුහුණ පෑමට සිදුවන අභියෝගයක් වන්නේ මින් කුමක් ද?
   I. නායකත්වය ලැබීම.
   II. ආර්ථික අපහසුතා.
   III. සහෝදර සිසුන්ගේ උදව් ලැබීම.
   IV. අන් අයගේ පිළිගැනීමට ලක්වීම.


13. සෑම පාසලකටම සුවිශේෂී වූ නිල ඇඳුමක් තිබේ. පාසල් නිල ඇඳුම මගින් බාහිර ලොකයට ප්‍රකාශ නොවන කරුණ වන්නේ මින් කුමක්ද?
   I. පාසලේ අනන්‍යතාව
   II. සමාන බව.
   III. චාම් බව.
   IV. පාසලේ ගුරු සිසු සංඛ්‍යාව.

14. පාසල් ගීතය ගායනා කරන අවස්ථාවේදී ප්‍රදර්ශනය කළ යුතු ඉරියව්වක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   I. පහසුවෙන් සිටිමින් ගායනා කිරීම.
   II. සීරුවෙන් සිටිමින් ගායනා කිරීම.
   III. වෙනත් කාර්යයක නියැලෙමින් ගායනා කිරීම.
   IV. තැන තැන ඇවිදිමින් ගායනා කිරීම.

15. පාසල මගින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩයක් වන්නේ මින් කුමක්ද?
   I. පරිසරය රැකගැනීමේ වැදගත්කම.
   II. දරුවන් පාසල් නොයවා රඳවා තබා ගැනීමේ වැදගත්කම.
   III. අයහපත් සිරිත් විරිත් පිළිපැදීම.
   IV. දරුවන්ට නිසි පෝෂණයක් අනවශ්‍ය බව.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

16. පහත දැක්වෙන රූප සටහනේ A හා D අක්ෂරවලින් නිරූපණය වන පරිපාලන ඒකක දෙක නම් කරන්න.
   A - ..................................   D - ....................................




17. ඔබේ පාසල අයත් පරිපාලන දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නම් කරන්න.
   පරිපාලන දිස්ත්‍රික්කය - ..........................................
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ..........................................

18. එම පරිපාලන ඒකක දෙකෙහි ප්‍රධානීන් නම් කරන්න.
   දිස්ත්‍රික්කය - ..........................................
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ..........................................



19. ඉහත රූප සටහනේ දැක්වෙන ප්‍රධාන වැවිලි බෝගය නම් කරන්න. ..........................................


20. එම බෝග වගාව සම්බන්ධව පර්යේෂණායතනය පිහිටා ඇති ප්‍රදේශය නම් කරන්න. ..........................................

(ලකුණු 20x2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක්ද අනෙක් ඒවා සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.

1. I පහත දැක්වෙන ගැලීම් සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.




A ....................... B ....................... C ....................... D ....................... (ල 4)

II ශිෂ්‍ය ශිෂ්‍යාවන් වන ඔබේ කාර්යයන් 2ක් ලියන්න. (ල 2)

1. ....................................... 2. .......................................

III අනධ්‍යන කාර්ය මණ්ඩලයේ කාර්යයන් 2ක් ලියන්න. (ල 2)

1. ....................................... 2. .......................................

IV පාසල් සංවිධාන ව්‍යුහයේ දක්නට ලැබෙන කමිටු තුනක් ලියන්න. (ල 3)

1. ....................................... 2. ....................................... 3. .......................................


V පාසල් ශිෂ්‍යයෙක් ලෙස ඔබතුල දක්නට ලැබෙන යහපත් ගතිලක්ෂණ හා අයහපත් ගතිලක්ෂණ පහත සටහනේ ලියන්න.




(ල 5)

2.


A


B

I ඉහත පින්තූරවලින් දැක්වෙන්නේ අපේ රටේ ශ්‍රේෂ්ඨ පුද්ගලයින් දෙදෙනෙකි. ඒ දෙදෙනා නම් කරන්න.

A ....................... B ....................... (ල 2)

II මෙම පින්තූරවලින් දැක්වෙන වියතුන් දෙදෙනා අපේ රටට හඳුන්වා දුන් ප්‍රතිපත්ති දෙක නම් කරන්න.

A ....................... B ....................... (ල 2)

III පාසැල් සිසුන් ලෙස ඔබට ඔබගේ ඉලක්ක ජය ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 3ක් ලියන්න.

1 ....................... 2 ....................... 3 ....................... (ල 3)

IV ඉලක්ක කරා ළඟා වීමේදී විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. එම අභියෝග ජය ගැනීම සඳහා ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 4ක් ලියන්න.

1 ............................................ 2 ............................................

3 ............................................ 4 ............................................ (ල 4)

3. I සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසි 3ක් ලියන්න.

1 ............................................

2 ............................................

3 ............................................ (ල 3)

| |
|---|
| * ක්‍රමානුකූලව කටයුතු කරයි.<br>* වැඩ කල් දමයි.<br>* කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනියි.<br>* තම අරමුණු ඉටුකර ගනියි.<br>* ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල නිරත වෙයි.<br>* පසුතැවීමට ඇති අවස්ථා වැඩිවෙයි. |

II ඉහත ප්‍රකාශ තුළින් සැලසුම් සහගත ශිෂ්‍යා සහ සැලසුම් සහගත නොවන ශිෂ්‍යා තුළ දක්නට ලැබෙන ලක්ෂණ තෝරා පහත වගුවෙහි ලියන්න.

| සැලසුම් සහගත ශිෂ්‍යා තුළ දක්නට ලැබෙන ලක්ෂණ | සැලසුම් සහගත නොවන ශිෂ්‍යා තුළ දක්නට ලැබෙන ලක්ෂණ |
|---|---|
| 1. ......................................... | 1. ......................................... |
| 2. ......................................... | 2. ......................................... |
| 3. ......................................... | 3. ......................................... |

(ල 6)

III 6 ශ්‍රේණියේ ඉගෙන ගන්නා පුංචි ඔබේ පංති කාමරය පවිත්‍රව හා පිළිවෙලට තබා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහනක් සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් ලියන්න.

1 ................................................ 2 ................................................ (ල 2)

4. I පාසල් සමාජයේ සාමාජිකයෙක් ලෙස අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ඔබ සතු අයිතිවාසිකමකි. එය භුක්ති විඳින ඔබෙත් ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.

1 ............................................

2 ............................................

3 ............................................ (ල 3)

II පාසැල් සිසුන්ට තම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට හා හැකියා දක්ෂතා වර්ධනය කර ගැනීමට රජය විවිධ පහසුකම් සපයා ඇත. රජය ඔබට සපයා ඇති පහසුකම් 4ක් ලියන්න.

1. ......................................... 2. .........................................

3. ......................................... 4. ......................................... (ල 4)

III පාසල විවිධ පුද්ගල කණ්ඩායම් සමග සම්බන්ධතා පවත්වමින් පාසලේ සංවර්ධනය පිණිස කටයුතු කරයි. පාසල සම්බන්ධතා පවත්වන පුද්ගල කණ්ඩායම් 4ක් නම් කරන්න.

1. ......................................... 2. .........................................

3. ......................................... 4. ......................................... (ල 4)

5. I භෞතික සම්පත් වර්ග කළ හැකි ආකාර නම් කරන්න.

1 ............................................ 2 ............................................ (ල 2)

II ඔබගේ වර්ගීකරණය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| .......................................... | .......................................... |
|---|---|
| 1. ..........................................<br>2. ..........................................<br>3. .......................................... | 1. ..........................................<br>2. ..........................................<br>3. .......................................... |

(ල 6)

III ජල සම්පතින් ලබාගන්නා ප්‍රයෝජන 3ක් ලියන්න.

1 ................................... 2 ................................... 3 ................................... (ල 3)

6. 

A



B

I (අ) ඉහත A පින්තූරයෙන් දැක්වෙන මානව සම්පතින් ලබාගන්නා ප්‍රයෝජන 2ක් ලියන්න.

1 .............................................. 2 .............................................. (ල 2)

(ආ) ඉහත B පින්තූරයෙන් දැක්වෙන මානව සම්පතින් ලබාගන්නා ප්‍රයෝජනයක් ලියන්න.

1 .............................................. (ල 1)

II ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබෙන සම්පත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන රැකියා ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සම්පත් | සම්පත් ආශ්‍රිත නිෂ්පාදන | නිෂ්පාදන ආශ්‍රිත රැකියා |
|---|---|---|
| කොහු | 1. ...................................<br>2. ................................... | 1. ...................................<br>2. ................................... |
| මැටි | 1. ...................................<br>2. ................................... | 1. ...................................<br>2. ................................... |

(ල 8)

7. I ඔබ ජීවත්වන ප්‍රදේශයේ මිනිසුන් සාමූහිකව කටයුතු කරන අවස්ථා 2ක් ලියන්න.

1 .............................................. 2 .............................................. (ල 2)

II සාමූහිකව කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න.

1 ................................... 2 ................................... 3 ................................... (ල 3)

III එදිනෙදා ජීවිතයේ දී අපට උදව්වන පුද්ගලයින් දෙදෙනෙක් හා ආයතන 2ක් නම් කරන්න.

පුද්ගලයින් - 1 ..........................................

2 ..........................................

ආයතන - 1 ..........................................

2 .......................................... (ල 4)

IV අපි සේවා ලබාගන්නා ආයතන සඳහා අපෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

1 ..............................................................................................

2 .............................................................................................. (ල 2)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 06 - 2024**

## පුරවැසි අධ්‍යාපනය

**පිළිතුරු පත්‍රය**

I කොටස

| | | |
|---|---|---|
| 01. ලොග් සටහන් පොත | 06. ✓ | 11. III |
| 02. ඇතුලත්වීමේ ලේඛනය | 07. ✓ | 12. II |
| 03. උප්පැන්න සහතිකය | 08. X | 13. IV |
| 04. විදුහල්පති | 09. X | 14. II |
| 05. නම හා උපන්දිනය | 10. ✓ | 15. I |

16. A - ග්‍රාමනිලධාරි කොට්ඨාසය
D - පළාත

17. අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.

18. දිස්ත්‍රික්කය - දිස්ත්‍රික් ලේකම්
ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය - ප්‍රාදේශීය ලේකම්

19. තේ වගාව

20. තලවකැලේ

II කොටස

1. I A ශිෂ්‍ය නායක නායිකා B අංශ භාර ගුරුවරු C විදුහල්පති D ආදිශිෂ්‍ය සංගමය
II දිනපතා පාසල් පැමිණීම/හොඳින් ඉගෙනීම් කටයුතු වල යෙදීම
විදුහල්පති ඇතුලු ආචාර්ය මණ්ඩලයට ගෞරව කිරීම (පිටුව 08)
III පාසලේ කටයුතු පවත්වාගෙන යාමට විදුහල්පතිමාට හෝ තුමියට,
ගුරුමණ්ඩලයට සහාය දීම
ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සුහදව කටයුතු කිරීම
ආරක්ෂක කටයුතු සඳහා සහය දැක්වීම (පිටුව 08)
IV පාසල් කළමනාකරණ/ක්‍රීඩා/සුබසාධක/ශිෂ්‍ය නායක මණ්ඩල (පිටුව 09)
V යහපත් ගති ලක්ෂණ - කාරුනිකයි/සත්‍යවාදියි/අවංකයි/ඉවසිලිවන්ත බව
අයහපත් ගති ලක්ෂණ - ආවේගශිලී බව/කේන්තියාම/අලසකම (පිටුව 14)

2. I A - සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා
B - සේනක බිබිලේ මහතා
II A - නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය
B - ඖෂධ ප්‍රතිපත්තිය
III 1. විෂයන්ට අදාළ අතිරේක පොත්පත් කියවීම.
2. අධ්‍යාපන වැඩසටහන් නැරඹීම
3. දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීම. (පෙළපොත 25 පිටුව)

IV  ආත්ම විශ්වාසය/ චිත්ත ධෛර්යය/ උනන්දුව/ කැපවීම
තම දුර්වලතා අවම කරගැනීම / අධිෂ්ඨානශීලී බව (පිටුව 25)

3. I  කාලය ඉතුරුවෙයි/කාර්යය පහසු කරයි/සම්පත් පිරිමැසෙයි
සතුටක් ඇතිවෙයි/ගැටලු අවම වෙයි (පිටුව 26)

II

| සැලසුම් සහගත | සැලසුම් සහගත නොවන |
| --- | --- |
| * ක්‍රමානුකූලව කටයුතු කරයි | * වැඩ කල් දමයි |
| * කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනියි | * ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල නිරත වෙයි |
| * තම අරමුණු ඉටුකරගනියි | * පසුතැවීමට ඇති අවස්ථා වැඩිවෙයි |

III  * පංතිකාමරයේ ඇති පරිහරණය වන දෑ හඳුනා ගැනීම.
* පවතින අඩුපාඩු හඳුනාගෙන සටහන් කර ගැනීම. (පිටුව 27)

4. I  *හොඳින් ඉගෙන ගැනීම * නීතිගරුක වීම * ගුරුවරුන්ට කීකරු වීම * ගරු කිරීම *
විනයගරුක වීම * ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න. (පිටුව 37)

II  නොමිලේ අධ්‍යාපනය ලබාදීම/පෙළ පොත් ලබාදීම/නිල ඇඳුම් ලබා දීම/විද්‍යාගාර පහසුකම්/පුස්තකාල පහසුකම්/පරිගණක පහසුකම් (පිටුව 36)

III  සුබ පතන්නන්/දෙමාපියන්/ආදි ශිෂ්‍යයන්/මහජන නියෝජිතයන්/පූජනීය උතුමන්

5. I  ස්වාභාවික / ස්වාභාවික නොවන

II  ස්වාභාවික :- හිරු එළිය/වාතය/ජලය/පස/කඳු/තැනිතලා/වනාන්තර/වෙරළ/ගංගා දිය ඇලි ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.

ස්වාභාවික නොවන :- ගොඩනැගිලි/ගංගාවන්/වැව්/අමුණු/ඇළමාර්ග/ළමා උද්‍යාන/යාන වාහන ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න

III  පානීය අවශ්‍යතා/ආහාර ද්‍රව්‍ය සකස් කර ගැනීමට/ සනීපාරක්ෂක කටයුතු සඳහා/කෘෂිකර්මාන්තය/ ප්‍රවාහනය/කර්මාන්ත/ජලවිදුලි බලය නිෂ්පාදනයට ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

6. I  A  ගෘහ භාණ්ඩ සාදාගැනීම සඳහා/දොර ජනෙල් සෑදීම/වහල සකස් කිරීම අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න

B  විනෝදය සතුට ලැබීම/මානසික සුවය ලැබීම වැනි අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න

II

| | | | | | |
| --- | --- | --- | --- | --- | --- |
| කොහු | :- කොහු | මෙට්ට | පාපිසි | ලණු | - නිෂ්පාදන |
| | කොසු සෑදීම | මෙට්ට සෑදීම | පාපිසි සෑදීම | ලණු ඇඹරීම | - රැකියා |
| මැටි | :- වළං / | ගඩොල් | - නිෂ්පාදන | | |
| | වළං සෑදීම | ගඩොල් කැපීම | - රැකියා | | |

7. I  ශ්‍රමදාන / දාන ගෙවල් / මළගෙවල් / මගුල් ගෙවල් /අවුරුදු උත්සව ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

II  අරමුණු ඉටුවීම/ කාලය ඉතිරිවීම/ සුහද බව වර්ධනය වීම/ මුදල් ඉතිරිවීම (පිටු අංකය 61)

III  පුද්ගලයින් - ග්‍රාම නිලධාරි/ප්‍රාදේශිය ලේකම්/මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා/ පොලිස් නිලධාරිතුමා ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

ආයතන - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය/මහ නගර සභාව/නගර සභා/ප්‍රාදේශිය සභා/රෝහල/පන්සල් පල්ලි ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

IV  නිසිපරිදි බදු මුදල් ගෙවීම/සේවා සපයන ආයතන හා එහි දේපළ රැක ගැනීම (පිටුව 70)